'අත් දෙක කොර දුප්පත් ශංකර් ඉන්දියාවේ දඟ පන්දු වීරයෙක්' යන මැයෙන් යුතුව ඉරිදා මව්බිම පුවත්පත මගින් ඉදිරිපත් කොට ඇති ලිපියේ අන්තර්ගත වන්නේ ධනාත්මක, දිරිය කතා පුවතකි. කෙසේ වෙතත් මෙහි ඇති ගැටළුව වන්නේ, මෙම ලිපියට ප්‍රස්තුත පුද්ගලයාට ඇති කායික ආබාධය සිරස්තලය තුළ ඉදිරිපත් කොට ඇති ආකාරයයි. එවන් යෙදුමක් වෙනුවට 'දෑත් වල ආබාධයක් සහිත' වැනි යෙදුමක් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

පුද්ගලයෙකුට තිබෙන යම් කිසි කායික හෝ මානසික ආබාධයක් සම්බන්ධ කොට ගනිමින් ජනමාධ්‍ය ඔස්සේ අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තරව සම්මත කොට ගත් ආචාර ධර්මයන් තිබේ. එක් උදාහරණයක් ලෙසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය මගින් ආබාධයන් සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ වූ සම්මේලනයේදී සම්මත කොට ගනිමින් හඳුන්වා දී ඇති ආචාර ධර්ම පද්ධතිය දැක්විය හැක. මෙම ආචාර ධර්මයන් ඉදිරිපත් කොට තිබෙන්නේද, එවන් පුද්ගලයින්ව ඍජුව හෝ වක්‍රව කොන් කිරීමකට ලක් වීම වැළැක්වීම සහ ඔවුන් වෙනස් ය යන හැඟීම ඔවුන් තුළ ඇති කිරීම වැළැක්වීම උදෙසායි.

මූලාශ්‍ර: https://www.ohchr.org/Documents/Publications/AdvocacyTool_en.pdf

#mediaethicsSL #SinhalaPress #lka #SundayMawbima